# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,407 — 1962 නොවැම්බර් 30 වැනි සිකුරාදා — 1962.11.30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙන ම ගොනුකරගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 615 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 618 | අය-වැය ලේඛන ... ... ... | 625 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 621 | දේපල විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 622 | මාගී කොමිටි දැන්වීම් ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... | 625 | විවිධ දැන්වීම් ... ... ... | 631 |


## පළාත් පාලන නිවේදන

### ගම් සභා ආඥාපනත

**13 වෙනි වගන්තිය යටතේ දැන්වීම**

1961 අංක 60 දරණ ගම් සභා (සංශෝධන) පනතින් සංශෝධිත (257 වෙනි අධිකාරය) ගම් සභා ආඥාපනතෙහි 13 (1) වෙනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, බටහිර කොට්ඨාශයේ සහකාර පළාත් පාලන කොමසාරිස් මෙරෙණ්ඩ් සුගේ සිරිල් චාර්ලිස් ප්‍රනාන්දු වන මම, කොළඹ දිස්ත්‍රික්කයේ උඩු-ගම්පොල-මාබොදල ගම් සභාවෙහි අංක 11 දරණ කොට්ඨාශයෙහි සභික කනුවන පතිරන්නැහැලාගේ පියසේන කරුණාතිලක මහත්මයා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙළින් සභාවේ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට, තමන් තෝරා පත් කර ගැනීමෙන් පසු, නොපැමිණි බව සෑහීමට පත්ව, කොළඹ දිස්ත්‍රික්කයේ උඩුගම්පොල-මාබොදල ගම් සභාවෙහි අංක 11 දරණ කොට්ඨාශයෙහි සභික කනුවන පතිරන්නැහැලාගේ පියසේන කරුණාතිලක මහත්මයා, මේ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කිරීමේ දිනය සිට සභිකත්වය අත්හරින ලද බව, මෙයින් ප්‍රකාශ කරමි.

ඇම්. සී. සී. ප්‍රනාන්දු,
සහකාර පළාත් පාලන කොමසාරිස්,
බටහිර කොට්ඨාශය.

1962 නොවැම්බර් මස 19 දීය,
අංක 267/6, ගාලු පාර,
බම්බලපිටිය.

11-1222

---

### ගම්සභා ආඥාපනත

**13 වෙනි වගන්තිය යටතේ දැන්වීම**

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධිත) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම්සභා ආඥාපනතෙහි 13 (1) වෙනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, මහනුවර පාලන දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස් බර්ටි ලියනමාන වන මම, මහනුවර දිස්ත්‍රික්කයේ උඩ බුලත්ගම අඹගමුව ගම්සභාවෙහි අංක 2 දරණ කොට්ඨාශයෙහි සභික ගල්ලොලුවගේ ඩෑනී දයාරත්න මහත්මයා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙළින් සභාවේ රැස්වීම් වාර 3කට වැඩි ගණනකට, තමන් තෝරාපත්කර ගනු ලැබීමෙන් පසු, නොපැමිණි බව ගැන සෑහීමට පත්ව, මහනුවර දිස්ත්‍රික්කයේ උඩබුලත් ගම අඹගමුව ගම්සභාවෙහි අංක 2 දරණ කොට්ඨාශයෙහි සභික ගල්ලොලුවගේ ඩෑනී දයාරත්න මහත්මයා මේ දැන්වීම ගැසට් පත්‍රයෙහි පලකිරීමේ දිනය සිට තම සභිකත්වය අත්හරිනලද බව, මෙයින් ප්‍රකාශ කරමි.

බී. ලියනමාන,
සහකාර පළාත් පාලන කොමසාරිස්,
මහනුවර පාලන දිස්ත්‍රික්කය.

1962 නොවැම්බර් 17 වෙනි දින,
මහනුවර දීය.

11-1166

## ගම්සභා ආඥපනත—198 වැනි පරිච්ඡේදය

### මැද කෝරළේ හෙල උඩ පළාත ගම් ප්‍රදේශයේ ගම්සභාව

සබරගමු පලාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ මැද කෝරළේ හෙල උඩ පළාත ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් පහත සඳහන් යෝජනාව සම්මත කර ගත් බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ගම්සභා කාර්‍යාලය,
දිගදූරේ–බලංගොඩ,
1962 කේ නොවැම්බර් 20 වැනිද.

සී. වී. පුල්ලේ,
සභාපති තැන, හෙළ උඩ පළාත ගම්සභාව.

### යෝජනාව

1952 කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සහා පොදු ආදර්ශ අතුරුව්‍යවස්ථා ආඥපනතේ 3 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මැද කෝරළේ හෙළ උඩ පලාත ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් 1955 ක්වූ නොවැම්බර් මස 23 වැනි දින අංක 10,872 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද යෝජනාවෙන් සම්මත කරගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 4 වැනි කාණ්ඩයේ 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ ප්‍රකාර මෙහි පහත සඳහන් මංමාවත් එකිනෙක ඉදිරියෙන් සඳහන් දිග හා පළල අනුව සාද හෝ නැවත සාද පවත්වාගෙන යනු ලබන බව මෙයින් යෝජනා කරනු ලැබේ.

තවද, මෙම ගම්සභාව විසින් 1961 කේ පෙබරවාරි මස 17 වැනි දින අංක 12,291 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද පාරවල් පිළිබඳ ලේඛණය මෙයින් අවලංගු කරනු ලැබේ.

| අංකය | පාරේ නම | දිග | | පළල |
|---|---|---|---|---|
| | | සැ. | දම්. | අඩි |
| 1. | දෙහිගස්තලාව—කහටපිටිය පාර | 0 | 60 | 18 |
| 2. | ගොරොක්ගහමඩ—කහටපිටිය පාර ... | 1 | 10 | 18 |
| 3. | ලංකාබරණ දමහණ පාර—ගලහිටිගමින් පටන් ගන්නා ... ... | 1 | 00 | 18 |
| 4. | කහටපිටිය—කොටුවල්පොල පාර | 3 | 60 | 18 |
| 5. | කිරිමැටිතැන්න—ඇල්ලෙපොල පාර | 0 | 60 | 18 |
| 6. | දෙහිගස්තලාව—බටුගම්මන පාර | 2 | 40 | 18 |
| 7. | කිරිමැටිතැන්න—පාසැල පාර | 0 | 02 | 18 |
| 8. | තැන්නෙහේන ඇලේලෙපොල පාර | 1 | 00 | 18 |
| 9. | කිරිමැටිතැන්න—සොහොන්බිම පාර | 0 | 10 | 10 |
| 10. | ගල්ගොඩ—වෙළගේ—ඇල්ලෙපොල පාර | 4 | 60 | 18 |
| 11. | වෙළගේ—පල්ලකන්ද පාර | 1 | 20 | 10 |
| 12. | ගල්ඉන්න—මාවෙල පාර ... | 2 | 30 | 10 |
| 13. | ගස්එරමුදු කැටිය—ඉහලගම පාර | 0 | 70 | 10 |
| 14. | ඇල්ලපොල—තලන්ගම පාර | 0 | 40 | 18 |
| 15. | දමහණ—විකිලිය පාර ... | 1 | 20 | 18 |
| 16. | තෙළිස්සන්කඳුර—කුඩා කපොල්ල පාර | 3 | 05 | 18 |
| 17. | දිගදූරේ—කොටුවල්පොල පාර | 1 | 50 | 18 |
| 18. | දමහණ—මාවෙල පාර ... | 1 | 05 | 10 |
| 19. | කොටුවල්පොල—අල්දෙර පාර | 0 | 75 | 18 |
| 20. | දෙපැලමුල්ල—මොරඋල පාර... | 0 | 20 | 10 |
| 21. | බෝගහකුඹුර—කුඹුක්දන—ගල්ගොඩ—ඇල්ලෙපොල පාර ... | 2 | 00 | 10 |
| 22. | මහවලතැන්න—කෝන්ගස්තැන්න පාර | 2 | 10 | 18 |
| 23. | මහවලතැන්න—රජවක පාර ... | 4 | 00 | 18 |
| 24. | කුඩාකපොල්ල—මැදගල්ගොඩ පාර | 1 | 20 | 10 |
| 25. | ඉඹුලමුරේ—හඳගිරිය පාර ... | 1 | 40 | 18 |
| 26. | ආදගලහෙල—ගල්ගොඩ පාර | 0 | 70 | 10 |
| 27. | තලවැල්ලෙප්—ගොඩකුඹුර පාර | 0 | 70 | 18 |
| 28. | අගලෙකුඹුර—රුක්මල්කඳුර පාර | 1 | 40 | 18 |
| 29. | මහවලතැන්න—මැදගල්ගොඩ—රජවක පාර | 1 | 40 | 10 |
| 30. | රජවක—මහවලතැන්න—ගොඩකුඹුර පාර | 0 | 60 | 18 |
| 31. | ඉඹුලමුරේ—අගලෙකුඹුර—හල්ගස්වත්ත පාර | 2 | 00 | 18 |
| 32. | බෝඹුව—මස්සැනිකන්ද පාර ... | 1 | 70 | 18 |
| 33. | තැඹිලින්කන්දෙනිය—රත්ඹිවිට පාර | 0 | 60 | 18 |
| 34. | හෝන්පොලතැන්න—බුලත්ගම පාර | 0 | 70 | 18 |
| 35. | හුලුඹය—අස්වැද්දුම පාර ... | 0 | 20 | 10 |
| 36. | බුලත්ගම—බැරන්දෙනිය පාර | 0 | 60 | 18 |
| 37. | බෝගහමුල—මස්සැනිකන්ද පාර | 0 | 60 | 18 |
| 38. | අඹපිටිය—මැදදෙකන්ද ස්ටෝරුව පාර | 1 | 00 | 18 |
| 39. | මැද්දකන්ද—හෙල බඹරබොටු පාර | 0 | 40 | 18 |
| 40. | ඇල්ලෙපොල—හොරකැටිය පාර | 2 | 40 | 18 |
| 41. | ඇල්ලෙපොල—කිරිමැටිතැන්න පාර | 1 | 60 | 18 |
| 42. | ගල්ඉන්න—ඉහළ අරාව පාර | 0 | 60 | 18 |
| 43. | ගල්ඉන්න—ඉලුක්කුඹුර පාර ... | 1 | 40 | 18 |
| 44. | ඇල්ලෙපොළ—ගල්ඉන්න පාර | 0 | 60 | 10 |
| 45. | හොරුන්කඳුර—ඉලුක්කුඹුර පාර | 1 | 20 | 10 |
| 46. | හොරකැටිය—වතුකන්ද පාර | 0 | 60 | 10 |
| 47. | වේඇළ-උඩ ඇල්ලෙපොළ පාර | 1 | 20 | 18 |
| 48. | ඇලේලෙපොළ—පල්ලෙවත්ත පාර | 0 | 20 | 18 |
| 49. | හොරකන්වල—මිරිස්වත්ත පාර | 0 | 70 | 18 |
| 50. | හොරකැටිය—බෙලිගල පාර ... | 0 | 40 | 18 |
| 51. | වතුකන්ද—ඇල්ලෙකන්ද පාර | 0 | 20 | 18 |
| 52. | පල්ලකන්ද—බෙලිගල පාර | 0 | 40 | 18 |
| 53. | බුලත්ගම—හුලුඹය පාර ... | 0 | 40 | 18 |
| 54. | කුඹගොඩ—රත්ඹිවිට පාර ... | 0 | 40 | 18 |
| 55. | බෝගහමුල—උඩුමුල්ල පාර ... | 0 | 40 | 18 |
| 56. | ඕලුගංතොට—කිරිමැටිතැන්න පාර | 0 | 60 | 18 |
| 57. | මුගුණමලේ—දෙරවෙල් ඔය පාර | 0 | 70 | 18 |
| 58. | පල්ලෙවල—එපිටපැත්ත පාර... | 0 | 70 | 10 |
| 59. | ගමඇළ—බඩහැළගොඩ පාර | 0 | 20 | 10 |
| 60. | නාගහමුළ—රදගොඩ පාර ... | 0 | 60 | 18 |
| 61. | බෝගහමුල—වැක්නෝල් පාර | 0 | 40 | 18 |
| 62. | බලංගොඩ—කිරිදිගල—මුගුණමලේ පාර | 0 | 50 | 18 |
| 63. | රාස්සගල පී. ඩබ්ලිව්. ඩී. පාරේ සිට මොරහැළ වත්ත දක්වා පාර ... | 0 | 10 | 10 |
| 64. | බෝවත්ත—දියවිනිහෙල පාර | 4 | 0 | 10 |
| 65. | මොළමුරේ—දියවින්න පාර ... | 1 | 60 | 10 |
| 66. | රජවක—ගොඩකුඹුර පාර ... | 1 | 10 | 18 |
| 67. | බෝවත්ත—රතඹලාගහආර පාර | 1 | 40 | 18 |
| 68. | බෝවත්ත—බලිදුවාවල පාර ... | 2 | 10 | 10 |
| 69. | ඇත්බැද්ද—බලිඳුවාවල පාර ... | 1 | 40 | 18 |
| 70. | බෝවත්ත—මොරඋල පාර ... | 1 | 40 | 10 |
| 71. | රජවක—කනිහන්මුල්ල පාර ... | 0 | 40 | 10 |
| 72. | බෝවත්ත—වටවල පාර ... | 1 | 35 | 18 |
| 73. | ඇහැළගහ අරාව පාර ... | 0 | 40 | 10 |
| 74. | කල්තොට—වේලිඔය පාර ... | 1 | 70 | 18 |
| 75. | මැදබැද්ද—හල්මිල්ලකඳුයාය පාර | 0 | 72 | 18 |
| 76. | ගල්ගොඩ—කල්තොට පාර ... | 1 | 40 | 18 |
| 77. | දික්පිටිහෙ—කල්තොට පාර ... | – | 35 | 18 |
| 78. | බුදුගල—කනපොතුආර පාර ... | 3 | 56 | 18 |
| 79. | දඩුමන්කඩ—මුල්ගම පාර ... | 2 | 55 | 18 |
| 80. | වැගුණපට්ටිය—කෙරතල පාර | 1 | 0 | 18 |
| 81. | රතඹලාගහආර—බලිඳුවාවල පාර | 0 | 50 | 18 |
| 82. | බලිදුවාව—මුල්ගම පාර ... | 1 | 65 | 18 |
| 83. | මුල්ගම—ගල්ගොඩ පාර ... | 1 | 60 | 18 |
| 84. | ගල්ගොඩ—තැන්න පාර ... | 1 | 5 | 18 |
| 85. | කනපොතුආර—කුඹුක්ගහආර පාර | 0 | 75 | 18 |
| 86. | කුඹුක්ගහ ආරේ සිට දියවින්න පාර | 1 | 45 | 18 |
| 87. | පියන්ගිරි හෙල පාර ... | 1 | 55 | 18 |
| 88. | පියන්ගිරි ඔයේ හෙල දක්වා පාර | 0 | 35 | 18 |
| 89. | කොටකීනේ සිට දියවින්න දක්වා පාර | 1 | 10 | 18 |
| 90. | දියවිනිහෙලේ සිට කටුපත්ඔය දක්වා පාර | 1 | 5 | 18 |
| 91. | රජවක—මහවලතැන්න—ගොඩකුඹුර පාර | 0 | 80 | 18 |
| 92. | දියවින්න—වේලිහෙලේ පාර ... | 3 | 40 | 10 |
| 93. | තන්ජන්තැන්න—ගල්ලැලිතොට පාර | 1 | 40 | 10 |
| 94. | දියවින්න—රැනගල ගම්සභා පාර | 5 | — | 10 |
| 95. | බෝවත්ත—හෙලේ පාර ... | 0 | 40 | 10 |
| 96. | බෝගහමුල—මස්සැන්න පාසැල පාර | 1 | 14 | 10 |
| 97. | කොටුවල්පොල—වළවේගහ පාර | 1 | 20 | 10 |
| 98. | බෝඹුව—නාගහමුළ—හුණුකුඹුර පාර | 1 | 10 | 10 |
| 99. | බෝඹුව—දෙරවෙල් ඔය පාර ... | 0 | 15 | 10 |
| 100. | දෙරවෙල්ඔය—හුණුකුඹුර පාර | 0 | 35 | 10 |
| 101. | වඩුහේන—මැස්සැන්න වත්ත පාර | 0 | 20 | 10 |
| 102. | දික්අරාව—උඩ අරාව පාර ... | 0 | 49 | 10 |
| 103. | උඩුමුල්ල—උඩකුඹුර පාර ... | 0 | 59 | 10 |
| 104. | දෙබරගල—උඩුමුල්ල පාර ... | 2 | 00 | 10 |
| 105. | තුඹගොඩ—අලුත් ඉඩම් කට්ටිය පාර | 0 | 40 | 10 |
| 106. | කිරිදිගල—තලන්මැදහීන්න—උඩහගම පාර | 1 | 00 | 10 |
| 107. | මහවලතැන්න—ඉදිගස්මුල්ල පාර | 2 | 40 | 18 |
| 108. | හල්දෙල—විල්පිට පාර ... | 1 | 40 | 10 |
| 109. | රත්නපුර පී. ඩබ්ලිව්. ඩී. පාරේ සිට වෙලේ ඇළ ගම්සභාපාර දක්වා ... | 0 | 22 | 10 |
| 110. | ඇල්ලෙක් කන්ද පාර ... | 0 | 28 | 10 |
| 111. | පහළවෙල හන්දියේ සිට කරත්ත පාරට යන පාර | 0 | 40 | 10 |
| 112. | මස්සැන්න ගම්සභා පාර—දෙරවෙල් ඔය පාර... | 0 | 10 | 10 |

11–1489

(ඇ) අයදුම් කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන් ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

**4. නව ප්‍රවේශක නිලධාරීහු.**—(i) අදාළ පරිදි විශ්‍රාම වැටුප් සහිත විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියම කොට නැත් නම්, අවුරුදු 3ක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත්, විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ සම්පාදිත නියෝග හෝ මින්, මතු සම්පාදනය කළ හැකි නියෝග වලටත් අනුකූලව ක්‍රියා කරන ලෙස "නව ප්‍රවේශක නිලධාරීන්වත්" නියම කරනු ලැබෙයි.

(iii) (අ) සවකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුළතදී සිංහල භාෂාව විෂයයෙහි ප්‍රවීණතාවක් ලබාගන්නා ලෙස මේ නිලධාරීන්ට නියම කරනු ලැබෙයි.

(ආ) ඔවුන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසාන යෙදී තනතුරුවලට සථිර කිරීම, වෙනත් කරුණු අතර සිංහල ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීම උඩ රඳා පවතී.

සවකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුළතදී සිංහල භාෂා ප්‍රවීණත්වයෙහි ලා නියමිත තත්ත්වයට පැමිණීමට නොහැකි වන නිලධාරීන්ගේ සේවය නැවැත්විය හැකිය. එහෙත්, රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් ලැබීම සඳහා අවංක ප්‍රයත්නයක් දරා ඇති බවට පළාත් පාලන සේවා කොමිෂන් සභාවට සෑහීමකට පත් විය හැකි නම් එසේ සේවය නතර කිරීම කල් දැමිය හැකිය. නියමිත දිනයෙන් පසු සාධාරණ කාලපරිච්ඡේදයක් ඇතුළත දී නිලධාරියා පරීක්ෂණයෙන් සමත් වුවහොත්, කොමිෂන් සභාවේ අභිමතය පරිදි, ජ්‍යෙෂ්ඨතාව සම්බන්ධයෙන් වූ පාඩුව නොසලකා හැරිය හැකිය.

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා ගන්නා "නව ප්‍රවේශක නිලධාරීහු" සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

**සටහන.**—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරි" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන් ය.

**5. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින් ම, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතු ය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

**6. සේවා මුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවා මුක්ත වූ අයදුම් කරුවනට, ඔවුන් ගේ නිත්‍ය භට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවලට නියමිත උපරිම වයස් සීමාව ඇතුලතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම්, ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

**7. වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.

**8. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බල මණ්ඩලයේ සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි සථිර තනතුරු දරන නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුව හොත් ඔවුන් සවකීය තනතුරුවලින් මුදාහරින්නට තමන් සූදානම් ව සිටිත් ද නැත්දැයි සඳහන් කළ යුතු ය.

**(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.**

(iv) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂක යාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොර තුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම්, රාජකාර්යයෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) අයදුම්පත් වනාහි මීට යාකොට ඇති ආකෘතියට සෑරානු කූලව පිළියෙල කොට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අවසාන දිනට පසු මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකාබලනු නො ලැබේ.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම් පත් ආකෘතිය

### පළාත් පාලන සේවය

**සැ. යු.**—(i) අයදුම්පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුර අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ සවකීය අයදුම්පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි-සිංහල-දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වේ නම් වෘත්තියශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතික.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

**————තනතුරු සඳහා වූ අයදුම් පතයි (——)**

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.

(ආ) ඉල්ලුම්කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැඳහුම් අංකයත් සඳහන් කරන්න.)

3. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස : අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :————.

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | | 1. | | |
| 2. | | | 2. | | |
| 3. | | | 3. | | |
| 4. | | | 4. | | |
| 5. | | | 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ/හෝ ශිල්පීය සුදුසුකම්, ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස්වූ දිනයත් දක්වමින් දැරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ සථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය යම් කලක නතර කරන ලද්දේ නම් එසේ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිළි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු, පළාත් පාලනායතන හා කාල සීමාවන්) : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය : ————.

(iii) විශ්‍රාම වැටුප් සහිත ද ? :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—

සේනාංකය, තරාතිරම, සේවයට බැඳුනු දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම හා භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තරය දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත් නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කොතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————. (ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ).

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### භාරකාර මාතෘ තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි. තෝරාගනු ලබන අපේක්ෂිකාව පළමු වරට කොළඹ නගර සභාවේ මහජනාධාර දෙපාර්තමේන්තුවේ නාගරික අනාථ නිවාසයට පත් කරනු ලබයි.

2. වැටුප : තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 2,220—120×13 රු. 3,780: රු. 3,180 වැටුපට පළමු කාර්යක්ෂමතා කඩයිම.

3. අවශ්‍ය සුදුසුකම් :

(අ) වයස :—1962 දෙසැම්බර් මස 18 දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂිකාවන් පුහුණුවූ ජන සෞඛ්‍ය හෙදියන් විය යුතු අතර සාමාන්‍ය හෙදි සහතිකය ඔවුනට තිබිය යුතුය. (සහතික වල පිටපත් අමුනා එවිය යුතුය).

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙළ කොට 1962 දෙසැම්බර් මස 18 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් කරන ලද ආකෘති පත්‍රයේ 13 වැනි කොටුවේ විශේෂ සුදුසුකම් යටතේ පහත සඳහන් කරුණු යොදා ගත යුතුයි :—

(1) හෙදි කටයුතු පිළිබඳ ලබා ඇති සුදුසුකම් පිළිබඳ විස්තර :————.

(2) පුහුණුවූ ජන සෞඛ්‍ය හෙදියක්ද යනු :————.

6. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාර ගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

7. සියලුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ. යම්කිසි අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රය, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට දින 5 ක් ඇතුළත ලැබුණු බව දන්වා එවනු නොලැබුව හොත් වහාම ඒ බව පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැන්විය යුතුයි. මේ විධිවිධානයට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත්, තම ඉල්ලුම් පත්‍රය සලකා බැලීම සඳහා ඇති යම්කිසි හිමිකමක් වෙයි නම් එය නැති වන්නේය.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති.

පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 530,
කොළඹ, 1962 නොවැම්බර් 24 දින.
11-1471

## පළාත් පාලන සේවය

### II වැනි ශ්‍රේණියේ ජලකර්මාන්ත ඕවර්සියර් තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි.

2. **වැටුප.**—තනතුරට නියමිත වැටුප් ක්‍රමය : වර්ෂයකට රු. 750—42×12 රු. 1,338—රු. 1,086 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩයිමකි,

3. **අවශ්‍ය සුදුසුකම් :**

(අ) **වයස.**—1962.12.18 වැනි දිනට වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුයි ;

(ආ) අයදුම්කරුවෝ යටත් පිරිසෙයින් පහත සඳහන් විභාග වලින් එකක් සමත් වී සිටිය යුත්තාහ :—

(i) සිංහල හෝ දෙමළ හෝ විෂයය සහිත ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ;

(ii) ඉංග්‍රීසි විෂයය සහිත සිංහල හෝ දෙමළ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය (මීට අමතරව දෝනා වැඩ හා ජල සම්පාදන යෝජනා ක්‍රම පිළිබඳ දැනුමක් හා පළපුරුද්දක් තිබිය යුතුය.)

(iii) පළපුරුද්ද හා සුදුසුකම් අනුව තෝරාගනු ලැබූ අයදුම්කරුවෝ වැටුප් ක්‍රමයේ යෝග්‍ය පියවරක තබනු ලැබෙති. අධ්‍යාපන සහතිකවල පිටපත් සහ දෝනා වැඩ සහ ජල සම්පාදන වැඩ ගැන පළපුරුද්ද සම්බන්ධයෙන් ලබා ඇති සහතිකවල පිටපත් ද අයදුම් පතට අමුණා එවන්න. මේ ලියකියවිලි අමුණා නොතිබේ නම්, එම අයදුම් පත ප්‍රතික්ෂේප කළ හැකිය.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව, සාරානුකූලව පිළියෙල කොට, 1962.12.18 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

6. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නොවේ.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතු වූ පිළිගතහැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. සියලුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ. යම්කිසි අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රය, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට දින 7ක් ඇතුළත ලැබුණු බව දන්වා එවනු නොලැබුව හොත්, වහාම ඒ බව පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැන්විය යුතුයි. මේ විධිවිධානයන්ට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත්, තම ඉල්ලුම් පත්‍රය සළකා බැලීම සඳහා ඇති යම්කිසි හිමිකමක් වෙයිනම් එය නැති වන්නේය.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1962 නොවැම්බර් මස 26 දින,
තැ. පෙ. 530, කොළඹ.

11-1459

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

### පළාත් පාලන ලේකම්වරුන්ගේ සේවයේ සිව්වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පවත්වන කාර්යක්ෂමතා කඩයිම් විභාගය—1963 පෙබරවාරි 9 දින

කොළඹදී පවත්වනු ලබන ඉහත සඳහන් විභාගය සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අයදුම් පත් කැඳවනු ලැබේ.

විභාගය පවත්වනු ලබන්නේ විභාග කොමසාරිස්තුමා විසිනි.

2. **අයදුම් පත්.**—(i) විභාගයට ඇතුළත්වීමේ අයදුම්පත් මෙහි පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයෙහි සාරානුකූලව පිළියෙල කොට "සභාපති, පළාත් පාලන සේවා කොමිෂන් සභාව, තැ. පෙ. 530, කොළඹ" යන ලිපිනයට එවිය යුතුයි.

(ii) අයදුම්පත් 1962 දෙසැම්බර් මස 18 වැනි දින හෝ ඊට පෙර පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපතිට ලැබෙන සේ, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. එදිනට පසු ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

(iii) අයදුම්කරුවන් සිය අයදුම් පත්‍ර එවිය යුත්තේ, තමන් දැනට සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානතුමා මාර්ගයෙනි. මෙසේ කිරීමට යම් අයදුම්කරුවකු අපොහොසත් වුවහොත් ඔහු විභාගයට නුසුදුස්සකු ලෙස සළකනු ලැබේ.

(iv) 1962 දෙසැම්බර් 18 වැනි දින හෝ ඊට ප්‍රථම පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන සේ සිය අයදුම් පත් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තමා සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලවල ප්‍රධානීන් වෙත සිය අයදුම් පත් කල්වේලා ඇතිව ඉදිරිපත් කරන ලෙස අපේක්ෂකයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

3. **විභාගයට ඇතුළත් කර ගැනීම.**—පිළිගනු ලැබූ අයදුම් පත්‍ර හිමි අයදුම්කරුවන්ට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති ප්‍රවේශ පත්‍ර නිකුත් කරයි. විභාගයට පෙනී සිටින අයදුම්කරුවෝ සවකීය ප්‍රවේශ පත්‍ර විභාගය පරිපාලනය සඳහා පත් කරනු ලැබ සිටින නිලධාරියාට ඉදිරිපත් කළ යුතුයි. එසේ ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් නොකරන අපේක්ෂකයින්ට විභාගයට පෙනී සිටීමට ඉඩ නොදෙනු ඇත.

අයදුම්කරුවන් තමනට නියමිත විභාග ශාලාවෙහි විභාගයට පෙනී සිටිය යුතුය. තමාට නියමකොට ඇති විභාග ශාලාව ඇරෙන්නට වෙනත් එකක විභාගයට පෙනී සිටීම සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට අවසර නොදෙනු ඇත.

ප්‍රවේශ පත්‍රයක් සමග කාල සටහනක පිටපතක් හා අයදුම්කරුවන්ට මග පෙන්වීම සඳහා විභාග කොමසාරිස්වරයා විසින් සම්පාදිත ව්‍යවස්ථා මාලාවක් ද එවනු ලැබේ. මෙම ව්‍යවස්ථාවන් අනුව අපේක්ෂකයන් බැඳී සිටිනු ලබන්නාහ. විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාගය පැවැත්වෙන දිනයෙහිදී සවකීය ප්‍රවේශ පත්‍රය විභාග ශාලාව භාර නිලධාරියාට භාරදිය යුතුයි.

විභාගය පැවැත්වෙන දිනයට යටත් පිරිසෙයින් දින 7 කට වත් පළමු ස්වකීය ප්‍රවේශ පත්‍රය නොලැබුණ හොත් ඒ බව වහාම "පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති, තැ. පෙ. 530, කොළඹ" යන ලිපිනයට දැනුම් දිය යුතුයි. ඇතුළත්වීමේ ප්‍රවේශ පත්‍ර නොලැබුණ බව දැනුම් දෙන අතරම පහත සඳහන් තොරතුරු ද සැපයිය යුතුය :—

(ඒ) විභාගයේ නම :————.

(බී) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

(සී) සම්පූර්ණ ලිපිනය :————.

සැ. යු.—විභාගයට ඇතුළත්කර ගැනීම ඊට සුදුසුකම් පිළිගැනීමක් සේ සළකනු නොලැබේ.

4. මේ විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ ඇතුළත්වීම අවලංගු කරන්නට පිළිවන.

5. **විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු.**—ප්‍රාදේශීය බලමණ්ඩලවල සේවය කරන පිළිගන්නා ලද අයදුම් පත්‍ර හිමි නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා රාජකාරි නිවාඩු දෙන ලෙස ප්‍රාදේශීය බලමණ්ඩලවල ප්‍රධානීන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

6. **හඳුනාගැනීමේ පත්.**—තමා පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාග ශාලා භාර නිලධාරියාට අයදුම්කරු තමා බව ඒත්තු ගැන්විය යුතුයි. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ :—

(ඒ) තැපැල්පතිතුමා විසින් නිකුත් කරනු ලබන හඳුනාගැනීමේ පතක් ;

(බී) මේ විභාගයේ දිනයට කලින් අවුරුදු 3 ක කාල සීමාව ඇතුළත දී නිකුත් කරන ලද වලංගු පාස්පෝට් පත්‍රයක් ;

(සී) මේ විභාගය පවත්වන දිනට කලින් අවුරුදු 3 ක කාල සීමාව ඇතුළත රජයේ දෙපාර්තමේන්තුවක් මගින් නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායාරූපයක් සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ වෙනත් ලියවිල්ලක්.

ප්‍රවේශ පත්‍රයට අමතරව, ඉහත සඳහන් ලියකියවිලි වලින් එකක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයින්ට විභාගයට පෙනී සිටීමට

**7. විභාග පරිපාටිය :**

(1) විභාගය සඳහා නියමිත විෂයයන් සහ එක් එක් විෂයයක් සඳහා නියම ලකුණුත් පහත දක්වේ :—

| | ලකුණු |
|---|---|
| (ඒ) සිංහල, දෙමළ ජාතික භාෂා දෙක | 100 |

මෙම පරීක්ෂණය කොටස් දෙකකින් යුක්තවේ :—

එනම් :—

(i) සම්භාෂණය හා අර්ථ නිරූපනය,

(ii) කියවීම සහ ලිවීම.

ඉහත සඳහන් 1 (ඒ) (i) රෙගුලාසිය යටතේ පවත්වනු ලබන පරීක්ෂණයේදී, නානාවිධ පංතිවලට අයත් සිංහල සහ දෙමළ භාෂාවන් කථාකරන අය තේරුම් ගැනීමේ සහ සාමාන්‍ය සම්භාෂණයෙහිදී සහ රාජකාරි කටයුතුවලදී තමා කථා කරන දෑ ඔවුන්ට තේරුම් ගැන්වීමෙහිදීත් අපේක්ෂකයාහට ඇති හැකියාව ගැන පරීක්ෂකවරයාට සෑහීමකට පත්විය හැකිද යනු පරීක්ෂා කරනු ලැබේ. සාමාන්‍ය රාජකාරි කටයුතු සම්බන්ධ කරුණු ගැන, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ කිසිම දැනීමක් නැති සිංහල සහ දෙමළ භාෂාව කථා කරන අයත්, පරීක්ෂකයා අතර, භාෂා පරිවර්තකයකු වශයෙන් ක්‍රියා කිරීමටද අපේක්ෂකයිනට සිදුවනවා ඇත. මෙම පරීක්ෂණයේදී නියමිත මුළු ලකුණු ගණනින් අඩුම වශයේ 60% වත් අපේක්ෂකයා විසින් ලබාගත යුතුයි.

ඉහත සඳහන් 1 (ඒ) (ii) රෙගුලාසිය යටතේ පවත්වනු ලබන පරීක්ෂණයේදී, විවිධ වැල් අකුරෙන් ලියන ලද සිංහල හෝ දෙමළ හෝ භාෂාමය කෙටි වාර්තා දෙකක ඉංග්‍රීසි පරිවර්තනයක් ලිවීමට, ඉංග්‍රීසි භාෂාවෙන් දෙන ලද නියෝගයක් සිංහලට හෝ දෙමළට පරිවර්තනය කිරීමට සහ සිංහල හෝ දෙමළ හෝ නොතාරිස් ඔප්පුවකින් සහ ගම්සභා උසාවි නඩුවාර්තාවකින් උපුටා ගන්නා ලදුව, පළමුවරට ඔහුගේ අතට දුන්, කොටසක් කියවා පරිවර්තනය කිරීමට අපේක්ෂකයා හට නියම කරනු ලැබේ. මෙම පරීක්ෂණයේදී නියමිත මුළු ලකුණු ගණනින් අඩුම වශයෙන් 60% වත් අපේක්ෂකයා විසින් ලබාගත යුතුයි.

| | |
|---|---|
| (බී) පළාත් ආණ්ඩු සභා සහ සුළුනගර සභාවල භාවිතාවන ගිණුම් ක්‍රම; සහ XIX වැනි සහ XX වැනි පරිච්ඡේදය හැර ආණ්ඩුවේ මුදල් රෙගුලාසිවල දෙවැනි කොටස (පැය 2 යි) ... ... | 100 |
| (සී) ලංකාවට අදාලවන පළාත් පාලන සිඬාන්ත සහ භාවිතය (පැය 2 යි) ... ... | 100 |

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ.

**පළමුවැනි කොටස :**

මෙම කොටසේ ප්‍රශ්න පත්‍ර පිළියෙල කරනු ලබන්නේ, නගර සභා, පළාත් ආණ්ඩු සභා සහ සුළුනගර සභා ආඥාපනත් සහ පළාත් පාලන සේවා කොමිෂන් සභා ආඥාපනත්, ඒවා යටතේ සම්පාදිත නීති රෙගුලාසි සහ අතුරු ව්‍යවස්ථා, ආදායම් මාර්ග, නානාවිධ ප්‍රාදේශීය බලමණ්ඩල සතු බලතල හා රාජකාරි කටයුතු, මහා ආණ්ඩුව හා ප්‍රාදේශීය බලමණ්ඩල අතර පවත්නා මුදල් සම්බන්ධතා, ගණන් පරීක්ෂණ බලතල හා මහා ආණ්ඩුවේ පාලනය පදනම් කරගෙනය.

**දෙවැනි කොටස :**

(i) මෙම කොටසේ ප්‍රශ්න පිළියෙල කරනු ලබන්නේ, ලංකාවේ ප්‍රාදේශීය බලමණ්ඩලවලට අදාළ අතිකුත් ආඥාපනත් පදනම් කරගෙනය.

(ii) සියලුම නිලධාරීන් එක් භාෂාවකින් සහ ගිණුම් සහ ලංකාවට අදාල වන පළාත් පාලන සිඬාන්ත සහ භාවිතය යන විෂයන් ගෙන් සමත් විය යුතුයි;

(iii) ඉහත සඳහන් 1 (බී) සහ (සී) රෙගුලාසි යටතේ පරීක්ෂණයට පෙනී සිටින අපේක්ෂකයන් විසින් ගිණුම් සහ ලංකාවට අදාල වන පළාත් පාලන සිඬාන්ත සහ භාවිතය යන විෂය යන්ට නියමිත මුළු ලකුණු වලින් අඩුම වශයෙන් 60% වත් ලබාගත යුතුයි.

(iv) අපේක්ෂකයින්ට අභිමත පරිදි භාෂා සහ ගිණුම් සහ ලංකාවට අදාල වන පළාත් පාලන සිඬාන්ත හා භාවිතය යන විෂයයන් වෙන වෙනම වරින් වර ගත හැක.

8. **නිදහස් කිරීම.**—(i) වයස අවුරුදු 50 ඉක්මවූ, එනම්, විභාගය පැවැත්වෙන දිනට පණස්වැනි ජන්ම දිනය පැමිණෙන්නාවූ නිලධාරීන්, කාර්යක්ෂමතා කඩඉමෙන් සමත් කිරීම සඳහා පවත්වනු ලබන පරීක්ෂණයෙන් නිදහස් කරනු ලබන්නේ, මෙම අනුග්‍රහය ලැබීමට නිලධාරීන් ඔවුන්ගේ වැඩ සහ චරිතය අතින් සුදුසුකම් ලැබීමෙන් සහ සම්බන්ධිත නිලධාරියා මෙම අනුග්‍රහය ලැබීමට යෝග්‍ය බවට එක් එක් නිලධාරියා ගැන කොමිෂන් සභාව සෑහීමකට පත්වී මෙන් පසුවය.

(ii) සිංහල/දෙමළ උසස් පෙළ හෝ සාමාන්‍ය පෙළ ප්‍රවීණතා පරීක්ෂණයෙන් සමත් සියලුම නිලධාරීන්, මෙම විභාගයට නියමිත ජාතික භාෂා පත්‍රයෙන් නිදහස් කරනු ලැබේ.

9. සාමාර්ථය ලද අපේක්ෂකයින්ගේ නම් ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ හතරවැනි කොටසේ ප්‍රසිඬ කරනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

තැ. පෙ. 530,

කොළඹ, 1962 නොවැම්බර් 26 වැනි දින දීය.

## ඉල්ලුම් පත්‍රය

### පළාත් පාලන සේවය

පළාත් පාලන ලේකම්වරුන්ගේ සේවයේ සිව්වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන කාර්යක්ෂමතා කඩඉම් විභාගය—1963.2.9.

අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනය: 1962 දෙසැම්බර් මස 18 වැනි දින.

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරින්)

2. පළාත් පාලන ලේකම් සේවයේ සිව්වැනි ශ්‍රේණියට පත්වූ දිනය :————.

3. දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

4. දැනට අයදුම්කරු සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලය :————.

5. සිංහල හෝ දෙමළ හෝ ප්‍රවීණතා විභාගයෙන් සමර්ථවූයේ ද? (උසස් පෙළද, සාමාන්‍ය පෙළද යන වග සඳහන් කරන්න :————.

6. කලින් වර්ෂයක මෙම විභාගයට පෙනී සිටියේද? එසේ නම් සමත් කළ විෂයයන් සඳහන් කරන්න :————.

7. ඔබ ගන්නා විෂයයන් පහත සඳහන් කරන්න (ඔව්/නැත කියා සඳහන් කරන්න) :—

(i) ගිණුම් හා පළාත් පාලන නීති :————.

(ii) සිංහල (අ) සම්භාෂණය සහ අර්ථ නිරූපනය :————.
(ආ) කියවීම සහ ලිවීම :————.

(iii) දෙමළ (අ) සම්භාෂණය සහ අර්ථ නිරූපනය :————.
(ආ) කියවීම සහ ලිවීම :————.

සැ. යු.—සිංහල සහ දෙමළ පරීක්ෂණය දෙකොටසකට බෙදනු ලැබේ: (අ) සම්භාෂණය සහ අර්ථ නිරූපනය (ආ) කියවීම සහ ලිවීම.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

ඉහත නම සඳහන් අයදුම්කරු මෙම ප්‍රාදේශීය බලමණ්ඩලයේ සේවයේ යෙදී සිටින බවත්, ඔහු පළාත් පාලන ලේකම්වරුන්ගේ සේවයේ සිව්වැනි ශ්‍රේණියේ සිටින බවත්, ඔහුගේ අයදුම් පතෙහි සඳහන් කර තිබෙන විස්තර නිවැරදි බවත් මම සහතික කරමි.

————,
සභාපති,
පළාත් ආණ්ඩු සභාව/සුළුනගර සභාව.

දිනය :————.

11—1460

# අතුරු ව්‍යවස්ථා

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 42 වැනි වගන්තිය යටතේ යාපනේ දිස්ත්‍රික්කයේ පුලොපල්ලෙයි ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව, එකී වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වි. චා. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1962 නොවැම්බර් මස 8 වැනි දින,
කොළඹ දී ය.

රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථා

1. (1) ආඥාපනතේ 39 වැනි වගන්තිය යටතේ අය කරනු ලබන රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත් වූ යම් රථවාහනයක් හෝ සතෙකු අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබා ගෙන හෝ සිටින්නාවූ සෑම අයකු විසින්ම සාමාන්‍යයෙන් මීට යාකොට ඇති "ඒ" උපලේඛනයේ සඳහන් පෝර්මයේ ප්‍රකාර විස්තර ලේඛනයක් ප්‍රධානතුමාට සැපයිය යුතුයි. මේ පෝර්ම ගම්සභා කාර්යාලයෙන් ලබාගත හැකිය.

(2) ආඥාපනතේ 39 වැනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටිය අය විසින් 1962 වැනි වර්ෂය වෙනුවෙන් (1) වැනි ඡේදයේ සඳහන් උපලේඛනය සම්පූර්ණ කොට 1963 මාර්තු 15 වැනි දිනට හෝ ඊට මත්තෙන් හෝ ප්‍රධානතුමා වෙත යැවිය යුතුයි. එකී අය ඒ

### කසළ ශෝධනය හා මළ බැහැරලීම

11. (1) සභාව විසින් සම්මත කරගන්නා ලද කසළ ශෝධනය හා මළ බැහැරලීම් පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල VI වෙනි කාණ්ඩයේ 6 වෙනි අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන කාරණා සඳහා ගම්සභාවට ගෙවිය යුතු අසූචි ඉවත් කිරීම පිළිබඳ මාසික ගාස්තුව එක බාල්දියකට රුපියල් දෙක බැගින් විය යුතු ය.

(2) ගම්සභාව විසින් සම්මත කර ගන්නා ලද කසළ ශෝධනය හා මළ බැහැරලීම පිළිබඳ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල VI වැනි කාණ්ඩයේ 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන කාරණා සඳහා ගම්සභාවට ගෙවිය යුතු කසළ ශෝධනය පිළිබඳ මාසික ගාස්තුව ශත පණහක් විය යුතු ය.

### අප්‍රසන්නවූ හා අන්තරායදායකවූ කර්මාන්ත

12. 1957 මැයි මස 3 වැනි දින අංක 11,114 දරණ ගැසට් පත්‍රයේ පළවූ අප්‍රසන්නවූ හා අන්තරායදායක වූ කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, එහි 1 වැනි අතුරු ව-වස්ථාවේ අවසානයට පහත දැක්වෙන අළුත් කාරණය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(ඞ) තොග ගණනේ හෝ සිල්ලරට විකිණීම පිණිස නරක්වන සුළු ආහාර හෝ ආහාර ද්‍රව්‍ය විකිණීම.

### පොදු දැන්වීම්

13. (1) කිසිවෙකු විසින් සභාවේ නියෝගය පිට ප්‍රදර්ශනය කර තිබෙන කිසිම දැන්වීමක් විරූප කිරීම හෝ විනාශ කිරීම නොකළ යුතුය ;

(2) සභාවේ යම් යම් අතුරු ව්‍යවස්ථා යටතේ ආරම්භ කරන ලද යම්කිසි කර්මාන්තයක් ක්‍රියාත්මක කරගෙන යාමේලා සභාපතිතුමාගේ බලය පිට පිහිටුවා ඇති යම්කිසි දැන්වීම් පුවරුවක්, වැටක්, කණුවක් හෝ බාධකයක් හෝ වෙනත් යම් දෙයක් ඉවත් කිරීම හෝ යම්කිසි දැන්වීමක සඳහන් නියමයන් උල්ලංඝණය කිරීම හෝ කිසිවෙකු විසින් නොකටයුතුය.

### වැටවල් නොබැඳි කුඹුරු හා ඉඩම්

14. (1) ගම් ප්‍රදේශ සීමා ඇතුළත වාසය කරන සෑම වැවිලිකරුවෙකු විසින්ම තමාගේ යම්කිසි කුඹුරකට හෝ වගා කළ ඉඩමකට ගවයන් ඇතුල්වීම වැළැක්වීම පිණිස, එකී කුඹුර හෝ වගා කළ ඉඩම හෝ වටේ වැටක් බැඳිය යුතු ය ;

(2) 1. ගවයන් අයිති සෑම කෙනෙකු විසින්ම, දවල් කාලය තුළ සවකීය ගවයන් යම්කිසි අයෙකුගේ ආරක්ෂාව යටතේ තැබිය යුතුය ;

(2) ගවයන් අයිති සෑම කෙනෙකු විසින්ම, තමාගේ ගවයන් දඩාවතේ යාමෙන් හා වගා කළ කුඹුරු හෝ වෙනත් ඉඩම්වලට ඇතුල්වීමෙන් වළක්වනු පිණිස, රාත්‍රි කාලයේදී දිගෙලිකොට හෝ බැඳ තැබීමට සැළැස්විය යුතු ය.

### වෙළඳ පොළවල්

15. (1) සභාව විසින් සම්මත කරගෙන තිබෙන වෙළඳ පොළවල් හා කඩ පොළවල් පිළිබඳ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල XXVII වැනි කාණ්ඩයේ 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කාරණය සඳහා වූ, "වෙළඳ ප්‍රදේශය", පල්ලෙයි පිහිටි ගම්බද වෙළඳ පොළේ මැද සිට සැතපුම් භාගයක අර්ධ විෂ්කම්භයක් ඇති චක්‍රයක් ඇතුළත වූ ප්‍රදේශය විය යුතු ය ;

(2) යම්කිසි ගම්බද වෙළඳ පොළක යම්කිසි ස්ථානයක් පාවිච්චි කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම සඳහා පහත සඳහන් ගාස්තු ප්‍රමාණයක් අය කළ හෝ ගෙවිය යුතු ය—

| | | රු.ශ. | |
|---|---|---|---|
| (1) එළවළු වෙළඳ පොළේ හතරැස් අඩි 18කට වැඩි නොවන විවෘත ස්ථානයක් සඳහා දිනකට | ... | 0 15 | යි. |
| (2) එළවළු වෙළඳ පොළේ හතරැස් අඩි 18කට වැඩි නොවන ආවරණ ස්ථානයක් සඳහා දිනකට | ... | 0 30 | යි. |
| (3) මාළු වෙළඳ පොළේ හතරැස් අඩි 18කට වැඩි නොවන ස්ථානයක් සඳහා දිනකට | ... | 0 30 | යි. |

### ආහාර ද්‍රව්‍ය විකිණීම

16. සභාව විසින් සම්මත කරගෙන තිබෙන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල XIII වැනි කාණ්ඩයේ සඳහන් ආහාර ද්‍රව්‍ය විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා මෙහි පහත දැක්වෙන ලෙස මෙයින් සංශෝධනය කර සිටිනු ලැබේ :—

(1) 1 සහ 3 වැනි අතුරු ව්‍යවස්ථාවල, "මාලු" යන වචනය, එම වචනය ඒ අතුරු ව්‍යවස්ථාවල සඳහන් සෑම ස්ථානයකදීම, එය අස්කොට ඒ වෙනුවට, "මාළු, හාල්, කුළුබඩු" යන වචන යෙදීමෙන් ද හා,

(2) 2 වැනි අතුරු ව්‍යවස්ථාවේ—

(අ) "මාළු, එළවළු" යන වචන අස්කොට ඒ වෙනුවට, "මාළු හාල්, කුළුබඩු, එළවළු" හා,

(ආ) "එළවළු වලට අමතර වශයෙන්" යන වචන අස්කොට, ඒ වෙනුවට, "හාල්, කුළුබඩු හා එළවළු වලට අමතර වශයෙන්" යන වචන යෙදීමෙන් ද වේ.

17. මේ අතුරු ව්‍යවස්ථාවල—

"සභාපති" යනුවෙන් සභාවේ සභාපතිතුමා අදහස් කරනු ලැබේ.

"ආඥපනත" යනුවෙන් 1961 අංක 60 දරණ පනතින් සංශෝධිත ගම්සභා ආඥපනත (257 වැනි අධිකාරය) අදහස් කරනු ලැබේ.

"ගම් ප්‍රදේශය" යනුවෙන් යාපනේ දිස්ත්‍රික්කයේ පුලොපල්ලෙයි ගම් ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

11-1196

---

ඇල්. ඞී.—බී. 22/61.
ප. පා. දෙ.—ජී. 2/288.

### සුසාන භූමි හා භූමදාන ආඥපනත

කෑගල්ල දිස්ත්‍රික්කයේ පනාවල් කෝරළ ගම්සභා සීමා තුළ පිහිටි භූමදාන ස්ථාන සඳහා, 1961 අංක 60 දරන ගම්සභා (සංශොධන) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 44 වෙනි වගන්තිය සමග කියවිය යුතු (231 වෙනි අධිකාරය වන) භූමදාන ආඥපනතේ 38 වෙනි වගන්තිය යටතේ නිසි බලධාරියා විසින් එනම් පනාවල් කෝරළේ ගම්සභාව විසින්, සම්පාදිතව සුසාන භූමි හා භූමදාන ආඥපනතේ 39 වෙනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලනය සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් ස්ථිර කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලනය හා නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් මස 9 වෙනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථා

1. මේ අතුරු ව්‍යවස්ථා යටතේ ලියා පදිංචි කරනු ලබන සියලුම භූමදාන ස්ථාන පිළිබඳව, සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයක වූ ලේඛනයක් සභාපති විසින් සභා කාර්යාලයේ තබා පවත්වාගෙන යා යුතුය.

2. (1) මේ අතුරු ව්‍යවස්ථා ගැසට් පත්‍රයේ පළකරනු ලබන දිනදී ගම් ප්‍රදේශය තුළ පිහිටා තිබුණු සෑම භූමදාන ස්ථානයක ම අයිතිකරු විසින් ඒ දිනයේ සිට මාසයක් ඇතුළත ඒ භූමදාන ස්ථානය ලියා පදිංචි කරවා ගැනීම පිණිස ඉල්ලුම් කළ යුතුය ;

(2) මේ අතුරු ව්‍යවස්ථා ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු යම්කිසි දිනයක යම් ප්‍රාදේශය තුළ පිහිටුවනු ලබන සෑම භූමදාන ස්ථානයක්ම අයිතිකරු විසින් ඒ දිනයේ සිට මසක් ඇතුළත ඒ භූමදාන ස්ථානය ලියා පදිංචි කරවා ගැනීම පිණිස ඉල්ලුම් කළ යුතුය ;

(3) භූමදාන ස්ථානයක් ලියා පදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක් ලියවිල්ලකින් විය යුතු අතර, ඒ භූමදාන ස්ථානයේ අයිතිකරු විසින් අත්සන් කොට සභාපති නමට යැවිය යුතුය.

3. භූමදාන ස්ථානයක අයිතිකරු විසින් එය වටකොට නිසි ලෙස වැටක් බැඳ ඒ වැට හොඳ තත්ත්වයෙන් පවත්වා ගෙන යා යුතුය. පදිංචිය පිණිස වූ යම් ගොඩනැගිල්ලක සිට භූමදාන ස්ථානයට තිබිය යුතු දුර ප්‍රමාණය යාර සියයකට අඩු නොවිය යුතුය.

4. කිසිම මිනීවලක් ගැඹුරින් අඩි සතර හමාරකට හෝ වෙන යම් මිනීවලක සිට දුරින් අඩි තුනකට අඩු නොවිය යුතුය.

5. භූමදාන කළ මෘත ශරීරයක් නැවත ගොඩ ගැනීමට නියෝග කිරීමේ බලය ඇති බලධාරියකුගේ නියමයක් පිට මිස, මෘත ශරීරයක් භූමදාන කොට අවුරුදු තුනක් ඇතුළත කිසිම මිනීවලක් කිසිම තැනැත්තකු විසින් විවෘත නොකළ යුතුය.

6. (1) සභාපති විසින් ඒ සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක් පිට මිස කිසිම තැනැත්තකු විසින් කිසිම භූමදාන ස්ථානයක කිසිම ස්මාරකයක් තැනීම හෝ තැනීමට සැලැස්වීම නොකළ යුතුය ;

(2) යම් ස්මාරකයක් සෑදීම සඳහා ඉඩ දෙනු ලබන ප්‍රදේශය හතරැස් අඩි හතරකට වැඩි නොවිය යුතුය ;

(3) (1) වැනි ඡේදය යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයකම, එකී අවසර පත්‍රය නිකුත් කරනු ලබන ස්මාරකය සම්බන්ධයෙන් ඉඩ දෙන ලද බිම් ප්‍රමාණය මෙතෙකැයි නිශ්චිතව සඳහන් කොට තිබිය යුතුය.

7. සභාපතිගේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිම තැනැත්තකු විසින් සුසාන භූමියක් හෝ ප්‍රසිද්ධ භූමදාන ස්ථානයක් නොවන කිසිම ස්ථානයක මෘත ශරීරයක් භූමදාන කිරීම හෝ ආදාහනය කිරීම නොකළ යුතුය.

8. මේ අතුරු ව්‍යවස්ථාවල—

"සභාපති" යන්නෙන් පනාවල් කෝරළේ ගම්සභාවේ සභාපති අදහස් වේ;

"අයිතිකරු" යන්නෙන් භූමදාන ස්ථානයක බුක්තියට හිමිකම් ඇති භාරකරු, කළමනාකරු, අයිතිකරු හෝ එම අන් තැනැත්තෙක් අදහස් වේ;

"සභාව" යන්නෙන් කෑගල්ල දිස්ත්‍රික්කයේ පනාවල් කෝරළ ගම් ප්‍රදේශයේ ගම්සභාව අදහස් කෙරෙන අතර;

"ගම් ප්‍රදේශය" යන්නෙන් පනාවල් කෝරළේ ගම් ප්‍රදේශය අදහස් වේ.

11-1215

# පළාත් පාලන සහා ඡන්ද ආඥපනත යටතේ දැන්වීම්

## ප්‍රාදේශික බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනත (262 වැනි පරිච්ඡේදය)

**මාතර දිස්ත්‍රික්කය**

හක්මන-වලකඩ ගම්සභාව

ප්‍රාදේශික බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනතේ (262 වැනි පරිච්ඡේදය) 36 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ හේවා ගමගේ ධර්මසේන මහතා, හක්මන-වලකඩ ගම්සභාවේ අංක 16 දරණ කොට්ඨාශය වෙනුවෙන් පෙනී සිටීම සඳහා ඡන්දයෙන් තෝරා පත් කරගන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
වැඩබලන (ප්‍රාදේශික බලමණ්ඩල) මැතිවරණ කොමසාරිස්.

1962 නොවැම්බර් 26 වැනි දින,
කොළඹ දීය.

11-1458

## ප්‍රාදේශික බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනත (262 වැනි පරිච්ඡේදය)

**මඩකලපුව දිස්ත්‍රික්කය**

කෝරලෙයි දකුණු ගම්සභාව

ප්‍රාදේශික බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥ පනතේ (262 වැනි පරිච්ඡේදය) 66 (2) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ, කෝරලෙයි දකුණු ගම් සභාවේ අංක 5 දරණ කොට්ඨාශය වෙනුවෙන් පෙනී සිටීම සඳහා ආරුමුගම් මුරුගේසු මහතා ඡන්දයෙන් තෝරා පත් කර ගන්නට යෙදුන බව ය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
වැඩ බලන (ප්‍රාදේශික බලමණ්ඩල) මැතිවරණ කොමසාරිස්.

1962 නොවැම්බර් 19 වැනි දින,
කොළඹ දී ය.

11-1161

## ප්‍රාදේශික බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනත (262 වැනි පරිච්ඡේදය)

**මන්නාරම් දිස්ත්‍රික්කය**

නානාඩ්ඩන් නැගෙණහිර ගම්සභාව

ප්‍රදේශික බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනතේ (262 වැනි පරිච්ඡේදය) 36 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ, පිලිප්පු සේරම් තොම්මයි සේරම් මහතා නානාඩ්ඩන් නැගෙණහිර ගම් සභාවේ කොට්ඨාශ අංක 11 වෙනුවෙන් පෙනී සිටීම සඳහා ඡන්දයෙන් තෝරා පත් කරගන්නට යෙදුන බව ය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
වැඩ බලන (ප්‍රාදේශික බලමණ්ඩල) මැතිවරණ කොමසාරිස්.

1962 නොවැම්බර් 19 වැනි දින,
කොළඹ දී ය.

11-1160

# අය-වැය ලේඛන

## බෙලිඅත්ත සුළු නගර සභාව

**මුදල් නීති රෙගුලාසි අංක 40(II) දරණ කොටස යටතේ අයදුම් පත**

වර්ෂ 1962—අය වැය කෙටුම්පත

පහත දක්වෙන ඉතිරි මුදල් යටතේ සඳහන් ශීර්ෂයන්ගේ මුදල ඒ හා සමග දක්වෙන වැඩිපුර වියදම් යටතේ සඳහන් ශීර්ෂවලට මාරුකර ඉන් වැය කිරීමට 1962 ක්වූ නොවැම්බර් මස 9 වන දින පවත්වන්නට යෙදුන සභා රැස්වීමේදී පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය බලාපොරොත්තුවෙන් සභා සම්මත කරගන්නා ලදී.

ඩබ්ලිව්. ඩී. ඇස්. ගලප්පත්ති,
සභාපති,
සුළු නගර සභාව, බෙලිඅත්ත.

සුළු නගර සභා කාර්යාලය,
බෙලිඅත්ත, 1962 නොවැම්බර් 9 වැනි දින.

| ඉතිරි වැය | රු. | ශ. |
|---|---|---|
| ඒ.—1 (බී) ලිපිකරුවන් ... ... ... | 400 | 0 |
| (සී) ආදයම් පරීක්ෂක ... ... | 100 | 0 |
| (අයි) නිවාඩු දුම්රිය බලපත්‍ර ... ... | 150 | 0 |
| (කේ) කාර්යාල ලී බඩු බාහිරාදිය ... ... | 400 | 0 |
| බී.—1 (බී) ඕවර්සියර් ... ... ... | 100 | 0 |
| 2 නඩත්තු කිරීම ... ... ... | 200 | 0 |
| සී.—4 නඩත්තු කිරීම ... ... ... | 500 | 0 |
| 8 ජීවනාධාර ... ... ... | 200 | 0 |
| ඩී.—1 (ඒ) (1) සෞඛ්‍ය පරීක්ෂක ... ... | 200 | 0 |
| (ජේ) සෞඛ්‍ය සති වියදම් ... ... | 50 | 0 |
| (ඇන්) මාතෘදරකාභිවෘද්ධි මධ්‍යස්ථානය ... | 300 | 0 |
| (ඕ) ජීවනාධාර ... ... ... | 500 | 0 |
| 2 (ඒ) වැටුප් ... ... ... | 250 | 0 |
| | 3,350 | 0 |

| අතිරේක වැය | රු. | ශ. |
|---|---|---|
| ඒ.—1 (ඒ) ලේකම් ... ... ... | 890 | 0 |
| (ඩී) පියන්වරු ... ... ... | 1 | 0 |
| (ඇෆ්) විශ්‍රාම වැටුප්... ... ... | 75 | 0 |
| 2 (ඒ) දීමනා ... ... ... | 84 | 0 |
| (සී) එකතු කරන්නාට කොමිස් ... ... | 350 | 0 |
| (ඊ) නීති ගාස්තු ... ... ... | 150 | 0 |
| (ඇෆ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණය, පළ කිරීම් සහ මුද්දර ... | 600 | 0 |
| බී.—4 වීථි ආලෝක කිරීම... ... ... | 150 | 0 |
| ඩී.—5 (බී) බඩු බාහිරාදිය ... ... | 800 | 0 |
| (අයි) ජීවනාධාර ... ... ... | 250 | 0 |
| | 3,350 | 0 |

| දෙවන කොටස—විදුලි අංශය | රු. ශ. | | රු. ශ. |
|---|---|---|---|
| 2(ඒ) ගොඩනැගිලි ... ... ... | 24 0 | 1(ඒ) තෙල් ... ... ... | 300 0 |
| 3(ඒ) උපකරණ ... ... ... | 100 0 | (බී) එන්ජින් තෙල් සහ බඩු ... ... | 140 0 |
| 4(ඒ) වැටුප් ... ... ... | 520 0 | 2(සී) මීටර්, ස්විච් සහ වෙනත් දේ ... ... | 29 0 |
| | | (ඩී) විදුලි මාර්ග නඩත්තු කිරීම ... ... | 25 0 |
| | | 4(බී) සේවක වැටුප් (එලිමහන්) ... ... | 150 0 |
| | 644 0 | | 644 0 |

සංශෝධනයකොට අනුමත කරමි,

ඇස්. සුන්දරමූර්ති,
පළාත් පාලන කොමසාරිස් වෙනුවට.

කොළඹ,
1962 නොවැම්බර් 21 වැනි දින.
11–1201

---

## සුළු නගර සභාව—මතුගම

අන්‍ය වැය සම්මතයන්හි අතිරේක මුදල් පියවා ගැනීම් සඳහා වැය සම්මතයන්ගෙන් ඉතිරිවන මුදල් යෙදවීම් සම්බන්ධයෙන් අංක 40(11) දරණ මුදල් රෙගුලාසිය යටතේ ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රය

1962, 1 වැනි කොටස—සාමාන්‍ය

| ශේෂ | රු. ශ. | අතිරික්ත | රු. ශ. |
|---|---|---|---|
| ඒ.—2(සී) බදු අයකරන්නන් සඳහා කොමිස් ... | 170 0 | ඒ.—1(ඇෆ්) විශ්‍රාම වැටුප් ... ... | 108 24 |
| ඒ.—2(ඩී) තක්සේරු කරන්නන්ගේ ගාස්තු ... | 750 0 | ඒ.—1(ජී) ජීවනාධාර හා විශෙෂ ජීවනාධාර ... | 337 0 |
| ඒ.—2(ඊ) නීතියේ කටයුතු සඳහා ... ... | 252 0 | ඒ.—2(ඒ) ආධාර (එලවන්සස්) ... ... | 140 0 |
| ඒ.—2(ජී) කරත්ත හා බෝට්ටු තහඩු මිල ... ... | 28 50 | ඒ.—2(ජේ) හදිසි වියදම් ... ... ... | 50 0 |
| ඒ.—2(කේ) කාර්යාල ලිබඩු උපකරණ ... ... | 1,600 0 | බී.—2 නඩත්තු කිරීම ... ... ... | 500 0 |
| ඒ.—2(ඇල්) නිළ ඇඳුම් ... ... ... | 109 14 | බී.—11 මැණීම ... ... ... | 400 0 |
| ඩී.—2(ඊ) ජීවන හා විශෙෂ ජීවනාධාර ... ... | 337 0 | සී.—1 වේතන ... ... ... | 100 0 |
| ඩී.—3(බී) කරත්ත ගොනුන් හා ලොරි ... ... | 500 0 | ඩී.—1(සී) ආධාර (එලවන්සස්) ... ... | 58 0 |
| ඩී.—3(ජී) ඉදි කිරීම ... ... ... | 239 0 | ඩී.—3(ඇෆ්) අත්පත් කර ගැනීම් ... ... | 170 0 |
| ජේ.—4 දුව දඩු ... ... ... | 96 0 | ඩී.—5(ඩී) අත්පත්කර ගැණීම ... ... | 250 0 |
| | | ඩී.—5(ඊ) ඉදි කිරීම ... ... ... | 1,355 40 |
| | | ඩී.—7(ඒ) වේතන ... ... ... | 150 0 |
| | | ජේ.—1 වේතන ... ... ... | 117 0 |
| | | ජේ.—3 පොත්පත් හා සඟරා ... ... | 100 0 |
| | | ජේ.—5 නඩත්තු කිරීම ... ... ... | 246 0 |
| | 4,081 64 | | 4,081 64 |

II වැනි කොටස—විදුලි අංශය

| | රු. ශ. | | රු. ශ. |
|---|---|---|---|
| 4.—(බී) සංචාරකසේවක වේතන හා ආධාර ... | 15 02 | 2.—(ඒ) ගොඩනැගිලි ... ... ... | 0 62 |
| | | 8.—ආපසු ගෙවීම් ... ... ... | 14 40 |
| | 15 2 | | 15 2 |

දයා වී. පස්කුවල්,
සභාපති,
සුළු නගර සභාව, මතුගම.

සුළු නගර සභා කාර්යාලය,
මතුගම, 1962 ඔක්තෝබර් 24 වැනි දින.

අනුමත කරන ලදී,

ඇස්. සුන්දරමූර්ති,
පළාත් පාලන කොමසාරිස්තුමා වෙනුවට.

1962 ක්වූ නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ දීය.
11–1314

---

## බළපිටිය සුලු නගර සභාව

1 වන පරිපූරක වැය—1962

කාණ්ඩ II

| වැය සිරස | රු. ශ. | යෝජනා සැඳහුම් |
|---|---|---|
| ඊ ඇල්. 3 (ඒ) ... | 2,500 00 ... | 62–4–3 දින යෝජනා අංක 14 |

යථෝක්ත රැස්වීමේදී මේය සභා සම්මත විය.

බළපිටිය,
1962 සැප්තැම්බර් 17 වැනි දිනදීය.

ඇල්. ඒ. ද සිල්වා,
සභාපති

අනුමත කරන ලදී,

ඇස්. සුන්දරමූර්ති,
පළාත් පාලන කොමසාරිස් වෙනුවට.

කොළඹ, 1962.11.21 දින දීය.
11–1267

## දෙවිනුවර සුළු නගර සභාව

### 1963 වර්ෂයට අය වැය කෙටුම් පත

### 1 වන කොටස—සාමාන්‍ය අංශය

| ආදායම් ශීර්ෂය | 1963 රු. | ශ. |
|---|---|---|
| **ඒ.—සාමාන්‍ය ආදායම :—** | | |
| 1. වරිපනම් බදු | 10,800 | 0 |
| 2. වාහන සහ සත්ව බදු | 200 | 0 |
| 3. බලපත්‍ර ගාස්තු | 2,900 | 0 |
| 4. වෙනත් බදු | 50 | 0 |
| 5. මුද්දර බදු වෙනුවෙන් | — | |
| 6. මත්පැන් බලපත්‍ර ආපසු ගෙවීම | — | |
| 7. අබිං ආදයමට වන්දි | — | |
| 8. දඩ මුදල් | 50 | 0 |
| 9. වෙන්දේසි බලපත්‍ර ගාස්තු | — | |
| 10. පොලිය | 750 | 0 |
| 11. පරණ ගබඩා බඩු විකිණීම | 25 | 0 |
| 12. වැඩිපුර ගෙවීම් ආපසු ගෙවීම | — | |
| 13. වරිපණම් දඩ මුදල් | 800 | 0 |
| 14. ජීවනාධාර ගෙවීම | 25,713 | 0 |
| 15. මිශ්‍ර ආදයම | 400 | 0 |
| 16. ආණ්ඩුවේ ආධාර | 8,542 | 0 |
| එකතුව | 50,230 | 0 |
| **බී.—මංමාවත් :—** | | |
| 1. කම්කරු බදු වෙනුවට ආධාර | 1,756 | 0 |
| 2. වෙනත් ආදයම් | — | |
| එකතුව | 1,756 | 0 |
| **සී.—සභාවට අයත් ගොඩනැගිලි හා ඉඩම් :—** | | |
| 1. බදු | 216 | 0 |
| 2. උපදින ද්‍රව්‍ය විකිණීමෙන් | 175 | 0 |
| 3. ඉඩම් විකිණීමෙන් | — | |
| එකතුව | 391 | 0 |
| **ඩී.—මහජන සෞඛ්‍යය :—** | | |
| 1. සාමාන්‍ය— | | |
| (ඒ) දඩ මුදල් | — | |
| (බී) වින්නඹු ගාස්තු | — | |
| (සී) මාතෘදරකාභිවෘද්ධි මධ්‍යස්ථානය :— | | |
| 1. ආණ්ඩුවේ දීමනා | 650 | 0 |
| 2. වෙනත් අය | 15 | 0 |
| | 665 | 0 |
| 2. කුණු කසල ශෝධනය :— | | |
| (ඒ) බදු | — | |
| (බී) කුණු කසල විකිණීමෙන් | 85 | 0 |
| (සී) කම්කරු දඩ | 25 | 0 |
| 3. වැසිකිලි ශෝධනය :— | | |
| (ඒ) බදු | 7,400 | 0 |
| (බී) ගාස්තු | 336 | 0 |
| (සී) කුණු කසල විකිණුම | 50 | 0 |
| (ඩී) කම්කරු දඩ | 25 | 0 |
| 4. ගවමඩු සහ මස් මරන ස්ථාන :— | | |
| (ඒ) ගාස්තු | — | |
